www.wsws.org ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ නය අර්බුදය ගැඹුරු වේ

## Sri Lanka's debt crisis worsens

සමන් ගුනදාස විසිනි
2010 පෙබරවාරි 18

ඓතිහාසික ප්‍රසාරනයක් අද්දර සිටින ජීවයෙන් පිරුන ආර්ථිකයක චිත්‍රයක් ඇඳ පෙන්වීමට ශ්‍රී ලංකාවේ ආන්ඩුව හා මහ බැංකුව ගන්නා ප්‍රයත්නයන් කෙසේ වෙතත්, රට ගැඹුරු ආර්ථික අර්බුදයකට මුහුන දී සිටී. යුරෝපයේ රටවල් ගනනාවක් මෙන් මෙරට ද දැඩි විදේශ නය බරින් සහ පුලුල්වන අයවැය හිඟයෙන් පීඩා විදී. එයට බලපා ඇත්තේ බොහෝ කොටම එල්ටීටීඊ යට එරෙහි යුද්ධයේ දැවැන්ත වියදමයි.

පසුගිය මැයි මාසයේදී හමුදාව එල්ටීටීඊය පරාජය කල නමුත්, එයින් සිදුව ඇත්තේ දිවයිනේ ආර්ථික ගැටලු ගැඹුරු වීම පමනි. පසුගිය සතියේ දී මහ බැංකු අධිපති අජිත් නිවාඩ් කබ්රාල් ලන්ඩන්හි සංචාරයේ යෙදුනේ විදේශ ආයෝජන සඳහා ශ්‍රී ලංකාව යෝග්‍ය තැනක් බව පෙන්වීමටය. ඔහු ප්‍රකාශ කලේ එක්සත් ජනපද ඩොලර් බිලියන 6 කින් පමන විදේශ සංචිත වැඩි වී ඇති බවත් එය මාස 06 ක ආනයන සඳහා සෑහෙන බව හා ආර්ථික වර්ධනය ගිය වසරේ සියයට 3.5 සිට 2010 දී සියයට 6.5 දක්වා නාටකාකාරව වැඩි වනු ඇති බවත් ය.

සත්‍යය නම්, විදේශ සංචිත ඉහල යෑම විශාල වශයෙන් රඳා පවතින්නේ, ආන්ඩුව ලබා ගත් වානිජ්‍ය නය හා අවුරුදු දෙකක කාලයක් තුල කොටස් වශයෙන් ලැබීමට නියමිත ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ (ජාමූඅ) ඩොලර් බිලියන 2.6 නය මුදලෙහි පලමු වාරික දෙක ලැබීමත් මතය. ජාමූඅ මෙම නය මුදල පසුගිය ජූලි මාසයේ අනුමත කලේ නය ගෙවීම පැහැර හැරීමේ හැකියාව ද සහිත බරපතල ගෙවුම් ශේෂ අර්බුදයකට රට මුහුන දී සිටි අවස්ථාවේ දී ය.

සන්ඩේ ටයිම්ස් ආර්ථික විශ්ලේෂක පසුගිය සතියේ මෙසේ අනතුරු ඇඟවී ය. "සංචිතවලින් (විදේශ මුදල්) වැඩි ප්‍රමානයක් අපනයනයන්ගෙන් උපයා ගත් මුදල් වලට වඩා නැවත ගෙවිය යුතු නයයි. මෙම අනියම් වගකීම්, රාජ්‍ය නය ඉහල දමන අතර එය ආර්ථිකයට දැඩි ගැටලුවක් වනු ඇත...."

හිතකර විදේශ හුවමාරු අගයන් පැවතීමට ලේඛකයා සඳහන් කල තවත් කරුනක් වූයේ විදේශයන්හි, විශේෂයෙන්ම මැදපෙරදිග සේවාවන්හි නියුතු අය මෙරටට එවන ලද මුදල්වල වැඩි වීමයි. විදේශ ප්‍රේෂන මුදල් 2009 පලමු මාස 11 තුල දී ඇමරිකන් ඩොලර් අගයෙන් සියයට 14.2 කින් වැඩිවුවත් සෑම අංශයකම සමස්ත අපනයනයන් සියයට 14.7 කින් තියුනු ලෙස කඩා වැටී ඇති බව ඔහු පෙන්වා දුන්නේ ය. තේ අංශයේ සියයට 10.2 ක වැටීම ද ඇතුලුව, කෘෂිකාර්මික අපනයන සියයට 12.3 කින් ද කාර්මික අපනයන සියයට 15.1 කින් පහත වැටුනි.

රෙදි සහ ඇඟලුම් අපනයනවල වැටීම සියයට 5.3 පමනක් වුවත්, හමුදාවේ යුද අපරාධ සහ මානව අයිතිවාසිකම් උල්ලංඝනය කිරීම මත යුරෝපා සංගමයේ ජීඑස්පී ප්ලස් වෙලඳ වරනය අහෝසි කිරීමේ තීන්දුව මෙම අංශයට දරුනු පහරක් වනු ඇත. ඇමරිකාව මෙන්ම යුරෝපා සංගමය ද මානව හිමිකම් ප්‍රශ්නය යොදා ගන්නේ ශ්‍රී ලංකා ආන්ඩුවට පීඩනය යොදමින් චීනය වැනි ප්‍රතිවිරුද්ධ බලයන්ගේ බලපෑම දුර්වල කිරීමටය. එහෙත් තව මාස හයකින් ජීඑස්පී ප්ලස් අවලංගු කිරීමට ගෙන ඇති තීන්දුව, ඇඟලුම් කර්මාන්තයට සහ රැකියාවන්ට විනාශකාරී බලපෑමක් ගෙන එනු ඇත. මෙම අංශයේ අපනයන්ගෙන් අඩකටත් වඩා ඇදී යන්නේ යුරෝපයට ය.

නවතම දත්ත ඇඟවුම් කරන්නේ, අඛන්ඩව වේගයෙන් වැඩිවන නය බරයි. මුලු නය රුපියල් ට්‍රිලියන 4.1 දක්වා (ඩොලර් බිලියන 35.6 ක්) ඉහල ගිය අතර, පසුගිය වසරේ සැප්තැම්බර් සිට ඔක්තෝබර් දක්වා රටේ ගෙවීමට ඇති නය රුපියල් බිලියන 83.2 කින් (ඩොලර් මිලියන 728 කින්) ඉහල නැඟී ඇත. පෙර මාසයට වඩා සියයට 29.6 ක වැඩිවීමක් සටහන් කරමින් විදේශ නය, රුපියල් ට්‍රිලියන 1.77 දක්වා වැඩිවීමත් එයට අයත් විය. ජනවාරි 26 ජනාධිපතිවරනය සඳහා සත්‍ය ආර්ථික තත්වය සැඟවීමේ කොටසක් ලෙස, ඉන් පසුවට මහ බැංකුව දත්ත ප්‍රකාශ කොට නැත.

2008 වසර සමඟ සසඳන කල, පසුගිය වසරේ පලමු මාස දහය තුල අයවැය හිඟය, සියයට 50 කටත් වඩා ඉහල ගිය අතර එය, දදේනි සියයයට 8.4 ක් කරා ලඟා විය. 2009 මුලු වර්ෂය සඳහා අපේක්ෂිත හිඟය දදේනි සියයට 11.3 ක් වන අතර මෙය ජාමූඅ නය

සඳහා පනවා තිබුනු සීමාව බෙහෙවින් ඉක්මවා ගිය තත්වයකි.

ආන්ඩුව, ජාමූඅ ඉලක්කයන් කරා ලඟාවීමේ මාර්ගයේ ගමන් ගන්නා බව සහතික කර ගැනීම සඳහා එය, කාර්තුවකට ඩොලර් මිලියන 330 ක වාරිකයක් බැගින් නිකුත් කරන ලදී. 2009 න් ආරම්භවන වසර තුන ඇතුලත දී අයවැය හිඟය පිලිවෙලින් දදේනි සියයට 7,6 හා සියයට 5 දක්වා අඩුකල යුතු ය. 2009 වසර සඳහා ගනන් බැලූ අයවැය දත්ත නිවැරදි නම් ආන්ඩුව එහි සීමාවන් සියයට 4.2 ක් තරම් ප්‍රමානයකින් ඉක්මවා ගොස් ඇත.

ජාමූඅ නේවාසික නියෝජිත කෝෂි මතායි ඉහල අයවැය හිඟය පිලිබඳව පසුගිය සතියේ අනතුරු ඇඟවී ය. වෙලඳපොල දුර්මුඛ නොකිරීමට වග බලා ගනිමින් මතායි ප්‍රකාශ කලේ "අයවැය තත්වය අභියෝගයක්.... අපට බැලීමට අවශ්‍ය වන්නේ ආන්ඩුව, පවත්නා හිඟය අඩුකිරීමේ මාවත ඔස්සේම ගමන් ගන්නවාද යන්නයි."

මෙම අනතුරු ඇඟවීමේ ඇත්තේ එක් අර්ථයකි. 2011 වන විට අයවැය හිඟය අඩකටත් වැඩි ප්‍රමානයකින් කපා හැරීමට ආන්ඩුවට බල කෙරෙන අතර මෙය ලඟා කර ගත හැක්කේ කම්කරු පන්තියේ ජීවන තත්වයන්ට හා පොදු වියදම්වලට දරුනු ප්‍රහාර එල්ල කිරීමෙන් පමනි. කාර්තු වශයෙන් කෙරෙන සමාලෝචනයක් සඳහා ජාමූඅ නියෝජිත කන්ඩායමක් මේ මාසය අගදී ලංකාවේ සංචාරය කිරීමට නියමිතය.

ජනාධිපතිවරනය සඳහා පෙර සූදානමක් ලෙස මුදල් ඇමතිවරයා ද වන ජනාධිපති මහින්ද රාජපක්ෂ, ජාමූඅ උපායික අනුමැතිය ද ඇතිව අයවැය කල්දැමී ය. දැන් රාජපක්ෂ, අප්‍රේල් 08 දිනට පාර්ලිමේන්තු මැතිවරනය කැඳවා ඇත්තේ කොලඹ දේශපාලන අර්බුදය වඩාත් ගැඹුරු කෙරී ඇති තත්වයක් තුලය. අයවැය ඉදිරිපත් කෙරෙනවා ඇත්තේ ඊලග ආන්ඩුව පිහිටුවීමෙන් පසුව පමනි.

කෙසේ වෙතත් ජාමූඅ, අප්‍රේල් වලට කලින් අයවැය හිඟය අඩු කිරීමට කටයුතු ආරම්භ කරන ලෙස රාජපක්ෂට බල කරනවා ඇත. මූල්‍ය අරමුදලෙන් ලබාගත් නයෙහි කොන්දෙසිවලට, බදු ප්‍රතිසංස්කරන මෙන්ම, විදුලිබල මන්ඩලය හා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව ද ඇතුලු ප්‍රධාන රාජ්‍ය ව්‍යවසායන් පුද්ගලීකරනය කිරීම ඇතුලත් ය. එලඹෙමින් තිබෙන මහ මැතිවරනය හමුවේ ඒ දෙසට තබන කුමන පියවරයක් වුවත්, දේශපාලන අර්බූදය වැඩි දියුනු කරනු නිසැකය.

2008 දී පුපුරා ගිය ගෝලීය ආර්ථික අර්බුදයේ නව අදියරක් සනිටුහන් කරමින් යුරෝපයේ ද අන් සෑම තැනකම ද රාජ්‍ය නය අර්බූදයක් ලඹ දෙමින් තිබේ. ග්‍රීසියේ අයවැය හිඟය සියයට 13 ඉක්මවා ගොස් තිබේ. එරට අයවැය හිඟය සියයට 3 දක්වා කැපීමේ එල්ලය ඇතිව යුරෝපා සංගමයේ බලධාරීන්, රාජ්‍ය සේවයේ වැටුප් සහ රැකියා කප්පාදු, විශ්‍රාම ගැනීමේ වයස අවුරුදු දෙකකින් දීර්ඝ කිරීම මෙන්ම, සෞඛ්‍ය ආරක්ෂන කප්පාදුව, ඉන්ධන සඳහා අතිරේක බදු පැනවීම සඳහා සැලසුම් ඉදිරිපත් කර තිබේ.

මෙරට තුලදී එහි බලපෑම කිසිසේත්ම අඩු නොවනු ඇත. මහා මැතිවරනය අවසන් වූ වහාම, "ආර්ථික යුද්ධය" ලෙස නම් කරගෙන ඇති එහි පිලිවෙත දියත් කිරීමට රාජපක්ෂ ආන්ඩුවට බල කෙරෙනු ඇත. මෙරට, "ආසියාවේ නැඟී එන විශ්මය" බවට පත්කරන මහා "විජයග්‍රහනයක්" පිලිබඳව ජනාධිපති වචන හරඹ කරන අතර තුර යථාර්තය නම්, වැඩකරන ජනතාවට මුලු බර දැරීමට සිදුවන්නේය යන්නයි. හමුදා භාෂාව පාවිච්චි කරමින් රාජපක්ෂ දැනටමත් පවසා ඇත්තේ කම්කරුවන් ද හමුදා සෙබලුන් මෙන් වැඩ කල යුතු අතර බරපතල පරිත්‍යාග කිරීමට සූදානම් විය යුතු බවයි.

© www.wsws.org